**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2019**
**-----------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
**---------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුවේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම,

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්‍වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 76 (ඇ) ඡේදය ප්‍රකාරව වාර්තා කරන දිනෙන් පසුව මාස 12 ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂිත වත්කම් ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ යුතු වුවත් එකතුව රු. 298,416,940 ක් වූ කෙටි කාලීන තැන්පතු 42 ක් සහ එකතුව රු. 12,650,598 ක් වූ ඉතිරි කිරීමේ ගිණුම් 09 ක් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 02 මුදල් ප්‍රවාහ ප්‍රකාශන අනුව මුදල යන්නට අතැති හා ඉල්ලුම් තැන්පතු අයත් වේ. මේ අනුව විශ්වවිද්‍යාල ස්ථාවර තැන්පතු වල ආයෝජන පරමාර්ථයෙන් මුදල් ආයෝජනය කොට ඇති බැංකුව දෙනු ලබන පොළී අනුපාතයද සැලකිල්ලට ගෙන ඇත. කෙටිකාලින (මාස 03) ස්ථිර තැන්පතු වල තැන්පත් කලද එම තැන්පතු අලුත් කිරීම් වලට යටත්ව ශේෂයන් අදාල අරමුණු සඳහා උපයෝජනය කරන තෙක් ආයෝජනයක් ලෙස පවත්වා ගනු ලැබේ. එමනිසා මෙම ශේෂයන් මුදල් හා සමාන දෑ යටතට නොව ආයෝජන ලෙස දක්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |

**1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුස්තකාල දත්ත පද්ධතියක වාර්ෂික අළුත්කිරීම් ගාස්තු ලෙස ගෙවන ලද රු. 3,142,905 ක් දෝෂ සහගත ලෙස පුස්තකාල පොත් ගිණුමට හර කිරීම නිසා එම පුස්තකාල පොත් වටිනාකම එම ප්‍රමාණයෙන් හා වර්ෂයේ ක්ෂය රු. 70,608 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 වසරේදී නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරමි. | ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.4 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පර්යේෂණ ව්‍යාපෘති 04 ක් සඳහා මිලදී ගත් එකතුව රු. 2,236,807 ක් වටිනාකමැති ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2020 වසරේදී නිවැරදි කිරීම් සිදුකිරීමට කටයුතු කරමි. | පර්යේෂණ ව්‍යාපෘති සඳහා මිලදී ගන්නා ස්ථාවර වත්කම් සියල්ල ප්‍රාග්ධනිත කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රසායන විද්‍යාගාර ගොඩනැගිල්ල හා නව කලාගාරය අළුත්වැඩියා කිරීමේ කාර්ය කොන්ත්‍රාත්කරු අත්හැර ගොස් තිබුණු බැවින් 2012 අප්‍රේල් 25 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 2,268,483 ක අත්තිකාරම් මුදලින් ආවරණය නොකළ වැඩ වෙනුවෙන් අයවිය යුතු රු. 1,764,013 ක් සමාලෝචිත වර්ෂය තුළදීද අය කර ගෙන නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | ලැබිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 42 දෙනෙකු පශ්චාත් උපාධි ලබා ගැනීම සඳහා විදේශගත වී නැවත සේවයට නොපැමිණීම හේතුවෙන් ගිවිසුම කඩවීම මත 2020 ජූනි 30 දිනට රු. 113,714,235 ක බැඳුම්කර වටිනාකමක් අයවිය යුතුව පැවතුණි. | 2019 වර්ෂයේ රු. 24,964,784.54 අයකර ගැනීමට කටයුතු කර ඇත. | නිශ්චිත කාල රාමුවක් සහිතව සියළු බැඳුම්කර ශේෂයන් අයකර ගත යුතු අතර බැඳුම්කර කඩවීම් ඉදිරියේදී ඇති නොවීමට ගිවිසුම්වල කොන්දේසි ශක්තිමත් කිරීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ආපදා ණය ශේෂය තුළ වසර 2 සිට වසර 3 දක්වා කාල පරාසයකට අදාලව එකතුව රු.241,980 ක් හා වසර 3ක් හා ඊට වැඩි කාලපරාසයකට අදාළව එකතුව රු.1,145,505 ක් විය. | 2020 වසරේදී රු.217,680 ක මුදලක් අයකර ගෙන ඇත. දෙදෙනෙකු සඳහා කම්කරු උසාවියේ නඩුවක් විභාග වෙමින් පවතින අතර ඉතිරි ණය මුදල අර්ථසාධක අයකිරිමේදී අයකිරීමට කටයුතු කරනු ඇත. | අයවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත් වැඩ 92 කට අදාළව 2013 වර්ෂයේ සිට පැවත එන එකතුව රු. 116,737,289 ක් වූ රැඳවුම් මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙහි ඇති ඇතැම් කොන්ත්‍රාත් නීම වී ඇති අතර ඒවා අවසන් කිරීමෙන් පසු රැඳවූ මුදල් නිදහස් කිරීමට කටයුතු කරනු ලැබේ. ඉතිරිය ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| XXIV පරිච්ඡේදයේ 3.18 වගන්තිය ප්‍රකාරව | ණය මුදල් අයකර ගැනීමට හෝ අයකර ගැනීමේ සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට හෝ කටයුතු නොකර එකතු වටිනාකම රු. 366,648 ක් වූ ආපදා ණය ලබාගෙන තිබුණු නිලධාරීන් 03 දෙනෙකුට වැටුප් රහිත නිවාඩු ලබා දී තිබුණි. | විගණන විමසුමේ සඳහන් තිදෙනාගෙන් එක් අයෙකුගේ ණය මුදල 2019 ජුනි මස සිට අයකරන අතර ඉතිරි දෙදෙනා විශ්වවිද්‍යාලයේ සේවයෙන් ඉවත්ව ඇත. ඔවුන්ගේ මුදල් අර්ථසාධක අරමුදලින් අයකිරීමට කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ආ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371 (2) හා (5) සහ 2015 ජුලි 14 | (i) තත්ත්කාර්ය අත්තිකාරම් ලබාගත් නිලධාරියකු අදාළ කාර්යය නිමකළ විගස හෝ දින දහයක් ඇතුළත එම | පැවතුනු සේවක වැඩවර්ජනය නිසා අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇති අතර ඒවා | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අත්තිකාරම් පියවිය යුතු වුවද එකතුව රු. 4,232,885 ක් වූ අත්තිකාරම් 84 ක් ආපසු පියවීම සඳහා දින 21 සිට දින 164 අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. | දැනටමත් පියවීමට කටයුතු කර ඇත. තවද සමහර අත්තිකාරම් අදාල කාර්ය නිමවීමෙන් පසු නියමිත කාලය තුල පියවීමට කටයුතු කර ඇත. | |
| | (ii) තත්කාර්ය අතුරු අග්‍රිම රු. 100,000 ක උපරිම සීමාවක් දක්වා ලබා දිය හැකි වුවද එම සීමාව ඉක්මවා නිලධාරීන් 07 දෙනෙකුට අවස්ථා 15 ක දී රු. 102,240 ක සිට රු. 277,800 ක් දක්වා පරාසයක් තුළ අත්තිකාරම් නිකුත් කර තිබුණි. | උපකුලපති තුමාගේ අවසරය මත අත්තිකාරම් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 396 | 2014 ජනවාරි 23 දින සිට 2019 මැයි 29 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ එකතු වටිනාකම රු. 1,303,000 ක් වූ අවලංගු කරන ලද චෙක්පත් 161 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් කමිටු නිර්දේශ මත ආදායමට ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රෙගුලාසි අනුකූළ විය යුතුය. |
| (ඇ) **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය**<br>-------------------- | | | |
| XX වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වෙනි පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය | අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කර නොතිබූ අතරම පැමිණීම පිටවීම සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් තීරණයක් ගෙන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපදෙස් දිය යුතුය. | පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුවේ. |
| (ඈ) **2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ **2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන** විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | චක්‍රලේඛ ප්‍රකාරව අනුමත ඉන්ධන සීමාව ඉක්මවා විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිවරුන් 06 දෙනා වෙනුවෙන් රු. 856,569 ක් වටිනා අතිරේඛ ඉන්ධන ලීටර් 6,797 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව පාලක සභාව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අතිරේක ඉන්ධන ගෙවීම් අනුමත කර ඇත. තවද විශ්වවිද්‍යාලය සතු වාහන ඉතා පැරණි බැවින් ඒවා ඉවත් කර අලුතින් වාහන ලබා ගැනීමට ඉල්ලුම් කළද ඒ සඳහා අනුමැතිය ලබාදී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| (i) රජයේ ප්‍රසම්පාදන අත්පොතේ 2.8.4 ප්‍රකාරව | කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 100 දක්වා වූ කොන්ත්‍රාත් වලට අදාලව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවල අවම වශයෙන් එක් සාමාජිකයෙක් රේඛීය අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයෙන් බාහිර අදාළ විෂයය සම්බන්ධයෙන් දැනුම ඇති අයෙකු විය යුතු වුවද රු. මිලියන 41.5 ක් වූ විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල විස්තාරණය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයන් තිදෙනාම විශ්වවිද්‍යාලීය නිලධාරීන් වූ බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් වටිනාකම අනුව නිසි ලෙස තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (ii)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.3 සහ 8.13.4 | අවිනිශ්චිත ප්‍රතිපාදන, ඇස්තමේන්තු ගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ඉක්මවා ගිය විට කොන්ත්‍රාත් විචලන සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ අධිකාරී මට්ටම් වෙත ඉදිරිපත් කළ යුතු වුවද පරිපාලන ගොඩනැගිල්ල විස්තාරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ සියයට 25 ඉක්මවූ රු. 10,557,915 ක විචලතාවය සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ගන්නා ලද තීරණයන්ට අනුව කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම නොඉක්මවන පරිදි කරන ලද අමතර වැඩ සහ විචල්‍ය අයිතමයන් සඳහා පාලක සභා අනුමැතිය ලබා ගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මානව ශාස්ත්‍ර පීඨයේ ලිපිකාරිණියක විසින් පරිගණකගත තොරතුරු වෙනස් කිරීම මඟින් රු. 3,763,349 ක බාහිර කථිකාචාර්ය දීමනා වංචා කර තිබුණු අතර ඒ පිළිබඳව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර ඉන් රු.3,355,624 ක් වාරික 3 කින් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. ඉතිරි රු. 407,725 ක මුදල සහ එයට අදාළ මූල්‍යමය පිරිවැය මෙතෙක් අයකර ගෙන | විධිමත් විමර්ශනයේ නිර්දේශයන් අනුව ඉතිරිය විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලෙන් අයකර ගැනීමට ඇයගේ කැමැත්ත ලබා ගෙන ඇත. ඇයගෙන් ලැබියයුතු ප්‍රමාණය ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රමිත අනුව මූල්‍ය වාර්තා වල පෙන්වා ඇත. මුදලින් රු.3,355,624 ක් අදාල ලිපිකාරිනිය විශ්වවිද්‍යාලයට ගෙවා ඇත. | වංචා හා වැරදි වැලැක්වීමට හා එවැනි ක්‍රියාවන් අනාවරණය කර ගැනීමටත්, ප්‍රමාණවත් හා යෝග්‍ය නව ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදීමට සහ යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

නොතිබුණු අතර බාහිර කථිකාචාර්ය දීමනා ගෙවීම්වලට අදාළ බලය දීම නිර්දේශය සහ අනුමැතිය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 871,320,870 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 159,969,855 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 711,351,015 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවක පාරිශ්‍රමික හා පාරිතෝෂික වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නව අදහස්, සොයා ගැනීම් සහ තාක්ෂණික දියුණුවත් නව රැකියා වෙළඳපොලත් වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් නව පාඨමාලා හඳුන්වා දීම සිදු කළ යුතු වුවද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් පසුගිය වර්ෂ 10 ක කාලසීමාව තුළ 2011/2012 හා 2015/2016 අධ්‍යයන වර්ෂ වලදී පමණක් පිළිවෙලින් නව පාඨමාලා එකක් සහ හතරක් පමණක් හඳුන්වා දී තිබුණි. | විශ්වවිද්‍යාලයේ ඇති සම්පත් සහ වාර්ෂික ප්‍රතිපාදන අනුව නව පාඨමාලා හඳුන්වා දී ඇත. | වාර්ෂිකව සලසනු ලබන මූල්‍ය ප්‍රතිපාදන වැඩිවීමට සමගාමීව නව රැකියා වෙළඳපල ඉලක්ක කර ගනිමින් නව පාඨමාලා හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල් 101 ක් යටතේ පැවති රු. මිලියන 32 කින්, අදාළ අරමුණ සඳහා උපයෝජනය කර තිබූ මුදල රු.මිලියන 5 ක් හෙවත් සියයට 15.6 ක් පමණ අඩු ප්‍රතිශතයක් වූ අතර ඉන් අරමුදල් 30 ක් යටතේ වූ රු. 20,385,955 ක් අදාළ අරමුණ වෙනුවෙන් උපයෝජනය නොකර අක්‍රීයව පැවතුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 40,074,900 ක් වූ පර්යේෂණ අරමුදල් ගිණුම් 36 ක් වසර 04 කට වඩා වැඩි කාලයක සිට උපයෝජනය කර නොතිබුණු අතර එකතුව රු. 4,699,502 ක් වූ පර්යේෂණ අරමුදල් ගිණුම් 08 ක් හා එකතුව රු. 73,067,553 ක් වූ විශේෂ අරමුදල් 15 ක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. | ශිෂ්‍යත්ව සහ ත්‍යාග අරමුදල් ආරම්භකොට ඇත්තේ විශේෂ අරමුණක් හෝ පරමාර්ථයක් සඳහාය. අදාල අරමුණ හා නිර්ණායකයන් ලඟා කර ගැනීමට සමත් වුවහොත් පමණක් උපයෝජයන කරනු ඇත. | අරමුදල් අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1994 ජුනි 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1998 වර්ෂය සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 50 ක්ද වශයෙන් එකතුව රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදුකර නොතිබුණි. | මෙතෙක් ගෙවීම් සිදු කර ඇත්තේ පවරා ගන්නා ලද කොටස් සඳහා වේ. ඉතිරි ඉඩම් ප්‍රමාණය ලබා ගැනීම සඳහා අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලබන අතර ඉක්මනින් විශ්වවිද්‍යාලයට ලබා ගැනීම විශ්වවිද්‍යාලයේද අභිප්‍රාය වේ. | පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 50 වන සංවත්සරය නිමිති කොට ගෙන, ජාත්‍යන්තර මට්ටමේ සම්මන්ත්‍රණ ශාලාවක් ව්‍යායාම් ශාලාවක් හා පිහිනුම් තටාකයක් සහිත ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා වූ රු.මිලියන 618 ක ඇස්තමේන්තුවකින් යුක්ත ව්‍යාපෘතියක් නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කරගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2014 පෙබරවාරි 13 දින ලබා දී තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ ශ්‍රවනාගාරය සඳහා උපදේශන ගාස්තු හා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2016 ජුනි 22 දින රු. 5,794,676 ක මුදලක් වැය කර තිබුණ ද මූලික ප්‍රසම්පාදන කටයුතු නිමකොට කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම වාර්තාවේ දිනය දක්වාම සිදුකර නොතිබුණි. | මෙය ප්‍රමාදවීමට හේතුව භූමිය නොතිබීම නිසා නොවන අතර මූල්‍ය ප්‍රතිපාදන අදාල අමාත්‍යාංශ වලින් ලබා නොදීමට හේතුවී ඇත. | අදාළ කාර්යයන් ප්‍රමාදයකින් තොරව ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විශ්වවිද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ල විස්තාරණය කිරීම සඳහා 2016 මාර්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු. මිලියන 49.14 ක වැට් රහිත පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණු අතර මාස 10 ක් ඇතුළත සමස්ථ ඉදිකිරීම් කටයුතු නිම කළ යුතුව තිබුණි. මුල් පිරිවැය ඇස්තමේන්තුවේ අයිතම කිහිපයක් ඉවත් කර වෙන වෙනම ඇස්තමේන්තු කිරීම හේතුවෙන් ඇස්තමේන්තුව රු. මිලියන 150.4 ක් දක්වා වැඩි වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා අනුමත මුල් පිරිවැය ඇස්තමේන්තුව රු. 91,619,877 කින් එනම් සියයට 186 කින් ඉක්මවා තිබූ අතර මෙම ව්‍යාපෘතිය 2020 ජුනි මස 30 දින වන විටත් අවසන් කිරීමටද නොහැකිවී තිබුණි. | ඒ ඒ වර්ෂවල විශ්වවිද්‍යාලයට ලැබෙන ප්‍රතිපාදන අනුව කොන්ත්‍රාත්තුව කොටස් වලට බෙදීම සිදුකර කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූල විය යුතුය.. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 1236 ක් ද අනධ්‍යයන කාර්ය මණ්ඩලය 1173 ක් හා අධ්‍යයන සහයක සහ පරිපාලන කාර්යය මණ්ඩලය 142 ක් ද වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 959 ක්ද, 1045 ක් හා 142 ක් ද විය. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 277 ක් ද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 128 ක් හා අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලයේ තනතුරු 37 ක් ද පුරප්පාඩුව පැවතුණි. | ඉංජිනේරු සහ තාක්ෂණ පීඨයන් අළුතින් ආරම්භ කළ පීඨ බැවින් ඒවායේ තනතුරු සඳහා බඳවා ගනිමින් පවතී. ඇතැම් විශේෂිත විෂයන් සඳහා සුදුසුකම් සහිත ආචාර්යාවරුන්ගෙන් අයදුම්පත් නොලැබෙන බැවින් බඳවා ගැනීම් ප්‍රමාද වී ඇත. පරිපාලන නිලධාරීන් පත් කිරීම විශ්වවිද්‍යාලය සිදු නොකරන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ එයට අදාළ ප්‍රගති වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | විගණනයට අවශ්‍ය තොරතුරු ලබාදිය යුතුය. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ සැලසුම් සැකසීමේදී මේ සම්බන්ධව අවධානය යොමු කර ඇති අතර ඉදිරි පස් අවුරුදු සැලසුමට අදාල දර්ශක ඇතුලත්ව කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2030 ඉලක්ක වලට අදාලව ආයතනයේ ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |